# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2025
# සිංහල භාෂාව හා සාහිත්‍යය

නම / විභාග අංකය : ........................................................................................................................................

| 07 ශ්‍රේණිය | I සහ II පත්‍රය | කාලය : පැය දෙක යි. |
|---|---|---|

- සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) වරණවලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- I සහ II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

- **අංක 01 සහ 02 ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අදහස ප්‍රකාශ වන පිළිතුර තෝරන්න.**

**(01)** මන්ත්‍රීතුමාගේ **ගජයෙකු** වූ මුදලාලි ගමේ මිනිසුන්ට නිතර ම හිරිහැර කළේ ය.

(1) සතුරෙකු (2) ඥාතියෙකු (3) මිතුරෙකු (4) සහෝදරයෙකු

**(02)** ඉන්දියාවේ සිදු වූ ගුවන් අනතුරෙන් එක් මගියෙක් පමණක් **අනූ නවයෙන්** බේරුණි.

(1) කැප කිරීමෙන් (2) අවසාන මොහොතේ
(3) ස්වල්ප වේලාවකින් (4) බොහෝ වේලාවකින්

- **අංක 03 සහ 04 ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය තෝරන්න.**

**(03)** ලොව පුරා සිටින ජනයාගෙන් වැඩි පිරිසක් තම කාර්යයන් පහසු කර ගැනීමට ඉලෙක්ට්‍රෝනික ........................ භාවිත කරති.

(1) උපාංග (2) කොටස් (3) යන්ත්‍ර (4) බැටරි

**(04)** රන් ආදි වටිනා ලෝහ භාවිත කරමින් විවිධ කලා කෘති නිෂ්පාදනය කිරීම අතීතයේ ........................ පැවතුණි.

(1) පහසුව (2) ප්‍රසිද්ධව (3) පෞරාණිකව (4) අප්‍රකටව

**(05)** ඉරි ඇඳි පද අයත් වන ක්‍රියා පද වර්ග පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

" මිණිතලයෙක තරු **හෙළා** - සඳුගෙන් ඇන අඹරලා
එම දූවිලි කුඩු **පිඹ පිඹ** - දේදුනුවල වැඩ දමා"

(1) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා (2) අවසාන ක්‍රියා, විධි ක්‍රියා
(3) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා (4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

**(06)** මහාප්‍රාණ අක්ෂර යෙදී **නොමැති** පද යුගලයක් සහිත පිළිතුර තෝරන්න.

(1) ප්‍රධාන - ශබ්ද (2) ඝ්‍රාණය - එළුවා (3) භූමිය - ලේඛනය (4) කනිෂ්ඨ - අවස්ථාව

**(07)** සියලු ම පද නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු පිළිතුර තෝරන්න.

(1) ප්‍රස්තාරය, ආශ්චර්යය, ශල්‍ය, සමස්ත (2) විස්මය, කොට්ඨාසය, ලේඛණ, ශ්‍රේෂ්ඨ
(3) තොරණ්, තෘෂ්ණාව, පිළිවෙළ, නිශ්චල (4) අධීක්ෂණය, පශ්චිම, සණ්ටාර, ශිඛර

**(08)** විරුද්ධාර්ථවත් පද යුගලයක් **නොවන** පිළිතුර තෝරන්න.

(1) අවමාන - අසමාන (2) යහගුණ - අවගුණ (3) අවුල් - නිරවුල් (4) සසල - නිසසල

**(09)** පැරණි ම සිංහල ව්‍යාකරණ ග්‍රන්ථය වන්නේ,

(1) කව්සිළුමිණ යි. (2) සිදත් සඟරාව යි. (3) සුභාෂිතය යි. (4) සද්ධර්මරත්නාවලිය යි.

**(10)** මුලින් දී ඇති පදයට ගැළපෙන සමානාර්ථ පදයක් යෙදී **නොමැති** පිළිතුර තෝරන්න.

(1) මුහුද = සමුදුර, සමුද්‍රය, සිඳු, සාගරය (2) ජලය = දිය, උදක, වතුර, වාරි
(3) දත් = දසන්, දන්ත, දළ, නෙත් (4) අහස = නුබ, අඹර, ගගන, ආකාශය

(11) "යසසින් වැඩි පත්තිනි කඳ තෙදිනේ
නුවරට ළඟ පස් නිරිඳුගෙ උයනේ
වට කොට දස දහසක් පිරිවරිනේ
අකලට අඹයක් පල ගති උයනේ"

ඉහත කවියේ ඇතුළත් සඤ්ඤක අක්ෂර යෙදුණු වචන ගණන වන්නේ,

(1) තුනකි. (2) හතරකි. (3) පහකි. (4) දෙකකි.

(12) ඉරි ඇඳි අක්ෂර අයත් වන අක්ෂර වර්ගවල නම් පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.

- <u>ශා</u>ලාව
- පු<u>ෂ්</u>පය
- <u>ස</u>මනලයා

(1) තාලුජ, මූර්ධජ, දන්තජ
(2) මූර්ධජ, තාලුජ, දන්තජ
(3) තාලුජ, දන්තජ, මූර්ධජ
(4) දන්තජ, මූර්ධජ, තාලුජ

(13) ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) වෙළෙන්දා වැඩි මිලට බඩු විකුණති.
(2) පොඩි නංගී කඩයට ගියේ ය.
(3) දෙමව්පියෝ දරුවන් රකිති.
(4) උණ පඳුරු සුළඟට සෙලවුණාහ.

(14) අතීත කාල ආඛ්‍යාතයක් යෙදී ඇති වාක්‍යයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ගස්වල රෝස මල් පිපී වැනෙයි.
(2) ස්වාමීන් වහන්සේ දනට වඩින සේක.
(3) ඔබ රැස්වීමට සහභාගී වන්නෙහි.
(4) විදුහල්පතිතුමා සිසුන් කාර්යාලයට කැඳෙව්වේ ය.

**• අංක 15 සහ 16 ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු පදය තෝරන්න.**

(15) ........................ අධ්‍යාපන චාරිකාවක් ගියෙහු.

(1) නුඹ (2) තෝ (3) නුඹලා (4) මම

(16) උපාසිකාව බුදු පුදයට ........................

(1) ගියහ. (2) ගියා ය. (3) ගියේ ය. (4) ගියෝ ය.

(17) මුලින් දී ඇති වාක්‍ය කොටස්වලට ගැළපෙන තනි පද නිවැරදිව යෙදී ඇති පිළිතුර තෝරන්න.

A. දිය යටින් ගමන් කරන ☞ යාත්‍රාව
B. සිතුවම් අඳින ලද වස්ත්‍රය ☞ පෙතිකඩ
C. රජුගේ ඇත්හල භාර ප්‍රධානියා ☞ ඇත්ගොව්වා
D. පට පණුවාගෙන් තනන රෙදි ☞ සේදරෙදි

(1) A සහ B (2) B සහ C (3) C සහ D (4) B සහ D

(18) පහත සඳහන් පුරුෂ ලිංග පදවලට ගැළපෙන ස්ත්‍රී ලිංග පද නිවැරදි පිළිවෙළට යෙදී ඇති පිළිතුර තෝරන්න.

- මොනරා
- මීයා
- මැතිතුමා
- අශ්වයා

(1) මීච්චි, සෙබඩ, මැතිනිය, කෙණෙර
(2) සෙබඩ, මීච්චි, මහත්මිය, ධේනුව
(3) සෙබඩ, මීච්චි, මැතිනිය, වෙළඹ
(4) ධේනුව, එළිච්චි, මැතිනිය, සෙබඩ

(19) "වත සුපිපි පියුමෙකි
නෙත සුනිල් මිණි යුවළෙකි
...................................................................
වනත නත මුත් කවුරු වෙති හැකි" - මෙම කවියේ හිස්තැනට සුදුසු පැදි පෙළ සහිත පිළිතුර වන්නේ,

(1) සිත රන්වන් මලෙකි
(2) සුවඳ හමන යස රුවෙකි
(3) ගත ගන රන් රුවෙකි
(4) ගණ රන්වන් මිණෙකි

(20) පහත සඳහන් වාක්‍යය ලේඛන ව්‍යවහාරයෙන් නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක් ද ?

**"එහෙම එකපාරට ම බහින්න බැහැ නේ."**

(1) එසේ එක් වර ම බැසීමට නො හැකි ය.
(2) මෙසේ එක පාරට ම බැසීමට නො හැකි ය.
(3) එහෙම එක් වර ම බැසිය නො හැකි යි.
(4) එහෙම එක පාරක් බැසිය නො හැකි ය.

(ලකුණු 02 x 20 = 40යි.)

## II - පත්‍රය

- 01 හා 02 ප්‍රශ්න අනිවාර්ය වේ. 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

**(01)** පන්ති කාමරයේ දී ඔබ කණ්ඩායම සකස් කළ **"බිත්ති පුවත්පත"** ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) ඔබේ කණ්ඩායම සකස් කළ බිත්ති පුවත්පතෙහි නම කුමක් ද ? (ලකුණු 02යි.)

(ii) බිත්ති පුවත්පත නිර්මාණය කිරීමේ දී ගුරුතුමිය / ගුරුතුමා ලබා දුන් උපදෙස් **දෙකක්** ලියන්න. (ලකුණු 04යි.)

(iii) බිත්ති පුවත්පත සඳහා ඉදිරිපත් කළ නිර්මාණ **දෙකක** නම් ලියන්න. (ලකුණු 04යි.)

(iv) ඒ සඳහා ඔබ කරුණු සොයා ගත් ක්‍රම **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

(v) බිත්ති පුවත්පත නිර්මාණය කිරීමෙන් ඔබ ලද ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 04යි.)

(මුළු ලකුණු 16යි.)

**(02)** පහත දැක්වෙන මාතෘකාවලින් **එකක් තෝරා ගෙන වචන 150කට නො අඩු** රචනයක් ලියන්න.

(i) මා කැමති ම ජාතික වීරයා

(ii) ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනයා

(iii) මම ගංවතුරකට මැදි වීමි.

(iv) පරිසරය සුන්දර කරමු.

(v) අධ්‍යාපනය සාර්ථක ජීවිතයකට මග පෙන්වයි. (ලකුණු 14යි.)

**(03)** ඔබ ජීවත් වන ප්‍රදේශයේ කානු පද්ධතිය අවහිරව පවතී. මේ නිසා ඩෙංගු, චිකන්ගුන්යා වැනි රෝග බෝ වීම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. එම කානු පද්ධතිය නිසි ලෙස පිළිසකර කර දෙන මෙන් ඉල්ලා මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට **ලිපියක්** ලියන්න. 'පරිසර මිතුරෝ' සංවිධානයේ ලේකම් ඔබ යැයි සිතන්න.

**නැතහොත්**

විදුහලේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිතයාණන් වශයෙන් සහභාගී වන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට ආරාධනා කරමින් විද්‍යාලයීය උත්සව කමිටුව විසින් යැවීමට සුදුසු **ආරාධනා පත්‍රයක්** සකස් කරන්න.

(ලකුණු 10යි.)

**(04)** පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) පහත දැක්වෙන පද යොදා අර්ථවත් වාක්‍යයක් බැගින් නිර්මාණය කරන්න.

- නුවන - ..........................................................................................................................................
- නුවණ - ..........................................................................................................................................

(ii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් උපසර්ග සහිත පද **දෙකක්** තෝරා ලියන්න.

සුසිරිත් සපිරි දනන් හට අභිමානයෙන් යුතුව ජීවත් වීමට භාග්‍යය උදා වනු ඇත.

- ..................................................
- ..................................................

(iii) පහත සඳහන් වචන නිවැරදි කර ලියන්න.

- තාක්ශණය - ..................................................
- විශ්මය - ..................................................

(iv) පහත දී ඇති යෙදුම්වල අර්ථය ලියන්න.

- කළු ගඟුල - ..................................................
- කිරි කබළු - ..................................................

(v) පහත සඳහන් පදවල අනුක්ත රූපය ලියන්න.

- මනාලියක් - ..................................................
- ඔබ - .................................................. (ලකුණු 02 × 05 = 10යි.)

**(05)** පහත සඳහන් ප්‍රශ්නවලට පෙළ පොත ඇසුරෙන් පිළිතුරු ලියන්න.

(i) සමනළ කන්ද ඇසුරෙන් බිහි වූ නිර්මාණ **දෙකක** නම් ලියන්න.

(ii) නිරන්තරයෙන් පරිසරයට මුදාහරින අපද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(iii) "සිනා කුමරි" පද්‍ය පන්තිය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද ?

(iv) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි රචනා කළ නිර්මාණ **දෙකක** නම් ලියන්න.

(v) "එන සිකුරාදා කොකු පණු දොස්තර
එනව ලු ළමයිනි ඩුං ඩුං ඩුං ඩුං
හොර ලෙඩ අරගෙන නැවිත් ඉන්නට
හොඳ නැහැ ළමයිනි ඩුං ඩුං ඩුං ඩුං" - මෙම කවි පෙළ රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද ?

(ලකුණු 02 × 05 = 10යි.)

**(06)** පහත සඳහන් ප්‍රකාශවල අවස්ථා සම්බන්ධය ලියන්න.

(i) "ඇයි, ඉතින්, ගැලවෙන විදියක් ඔබ ම කල්පනා නො කරන්නේ ?"

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද ? (ආ) මෙම ප්‍රකාශය සඳහන් පාඩමේ නම කුමක් ද ?

(ii) "තොපි මරණ නළලේ තබා අවු ද ?"

(අ) මෙසේ ප්‍රශ්න කළේ කවුරුන් ද ? (ආ) එම ප්‍රශ්නය අසන ලද්දේ කවුරුන්ගෙන් ද ?

(iii) "ඒකට කමක් නෑ. උඹ පලයන් නුවර."

(අ) මෙසේ කීවේ කවුරුන් ද ? (ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් මුල් ග්‍රන්ථය කුමක් ද ?

(iv) "ඔන්න ඔයාට උදේට ආප්පත් කන්න පුළුවන් හොඳේ."

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද ? (ආ) මෙම ප්‍රකාශය සිදු කළ ස්ථානය කුමක් ද ?

(v) "ජාතික දේ අගේ කරමින් පුන්කලසට ගොක් සැරසිල්ලට දෙව් මැඳුරෙත් සැලකිය යුතු අවස්ථාවල දී සුදුසු තැන් දුන් කලාකාමියෙකි."

(අ) මෙම ප්‍රකාශයෙන් කියැවෙන්නේ කවුරුන් ගැන ද ?
(ආ) එතුමා විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් නම් කරන්න. (ලකුණු 02 × 05 = 10යි.)

**(07)** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

අතීතයේ භාවිත වූ ගැල නොහොත් කරත්තය, ජන ජීවිතයට වඩාත් සමීපව පැවති දෙයකි. මන්දයත් ජනගහන වර්ධනය, මිනිස් අවශ්‍යතා පුළුල් වීම, භාණ්ඩ හුවමාරු ක්‍රමය වඩාත් ප්‍රචලිත වීම ආදි සාධක හේතු කොට ගෙන කරත්තයේ වැදගත්කම වැඩි විය. කරත්ත අතර "බර කරත්තය" එකල විශාලතම වාහනය විය. එහි ධාරිතාව මෙන් ම ගෙන යා හැකි භාණ්ඩ ප්‍රමාණය ද අධික විය. ශක්ති සම්පන්න ගොනුන් දෙදෙනකු විසින් ඇදගෙන යනු ලබන කරත්තයේ රෝද දෙක සවි කරන ලද අලවංගු කඳේ සිට හරි මැදින් ඉදිරියට සවි කරන ලද මහ ලී කඳ, "ඒරිකඳ" නමින් හැඳින්වේ. ඒ ඉදිරිපස දෙපැත්තෙහි ගොනුන් දෙදෙනා බැඳිය හැකි අයුරින් හරහට කරපොල්ල සවි කර ඇත.

දින ගණනක් ගත වන දුර බැහැර ගමන්වල දී උයා පිහා ගෙන කෑමට අවශ්‍ය හැළි වළං අඩුක්කුව කරත්ත ඇන්දේ එක් පසෙක ද වතුර කළ ගෙඩිය අනෙක් පසෙහි ද නොසෙල්වෙන සේ එල්ලා ගනිති. වර්තමානයේ මහා මාර්ග දෙපස දක්නට නොලැබුණ ද එකල මාර්ගවල තැනින් තැන ගාල් ද තිබුණි. ගැල්කරුවන් ගවයන් ලිහා උන්ට විවේක දෙන ගමන් ම උයා පිහා ගෙන කා තමන් ද විවේක ගන්නා ඉඩ පහසුකම් ඇති ස්ථානයක් සේ ගාල තෝරා ගැනිණි. මෙසේ විවේක ගන්නා අතර ද ගැල් ගමන් ගන්නා අතර ද තම පාළුව, වෙහෙස නිවාලන්නට ඔවුහු කවි ගායනා කළහ.

(i) අතීතයේ කරත්තය ජන ජීවිතයට වැදගත් වීමට බලපෑ හේතු **දෙකක්** ලියන්න.

(ii) බර කරත්තය එකල විශාලතම වාහනය ලෙස සැලකීමට මූලික වූ කරුණ කුමක් ද ?

(iii) "ඒරිකඳ" නමින් හැඳින්වූයේ කුමක් ද ?

(iv) ගාලේ දී ගැල්කරුවන් විසින් සිදු කරන ලද කාර්ය **දෙකක්** ලියන්න.

(v) මෙම ඡේද කොටසෙහි ඇතුළත් යුගල පද **දෙකක්** උපුටා ලියන්න. (ලකුණු 02 × 05 = 10යි.)